රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 40/94

මගේ අංකය :- III/0266/2/68/එල්/එච්ජ්-94(2)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1994.12.16 වෙනි දින.

සියළුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

<u>ලෝහෝර් ආර්යා ණය මුදලේ වාරික අය කිරීම.</u>

සමහර අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල සහ පළාත් පාලන ආයතන විසින් ලෝහෝර් ආර්යා අරමුදල වෙත ලැබිය යුතු මාසික ණය වාරික නිතිපතා ගෙවනු නොලබන බව එම අරමුදලේ පාලන භාරකරු විසින් මුදල් අමාත්‍යාංශය මඟින් මා වෙත දන්වා ඇත. ස්ථාන මාරුවීම, විශ්‍රාම ගැනීම, සේවයෙන් ඉවත්වීම හා තනතුර හැර යාම වැනි කරුණු වලදී ණය ආපසු අය කිරීම සම්බන්ධයෙන්, පරිපාලන හා මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතුය. ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1:6, 4:2:4, 4:2:5 සහ 4:5 වගන්ති ද 1974.07.26 දිනැති සීඩී 41 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය හා 1970.10.24 හා අංක 11 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි ද ඔබේ අවධානය යොමු කරමි. ආයතන සංග්‍රහයේ ඉහත වගන්ති වල විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ යැයි සඳහන් තැන්හි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ හෝ විශ්‍රාම වැටුප් ගෙවීමේ බලධාරියා හෝ යනුවෙන් සලකා කටයුතු කළ යුතුය.

02. I. මෙම අරමුදලට ණය වී සිටින නිලධාරියකු මාරු කරනු ලැබූ විට එම ණය පිළිබඳ විස්තර මාරුවී යන දෙපාර්තමේන්තු ප්‍රධානියාට දැන්විය යුතු අතර, එම විස්තර ලෝහෝර් ආර්යා අරමුදල් පරිපාලකට ද දැන්විය යුතුය.

II. අරමුදලට ණය වී සිටින රජයේ නිලධාරියකු විශ්‍රාම ගන්නා බව දැනුම් දුන් විට, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඒ බව අරමුදලේ පරිපාලක වෙත වහාම දැන්විය යුතු අතර, විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂික මුදලෙන්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂට/විශ්‍රාම වැටුප් ගෙවීමේ බලධාරියාට එම හිඟ මුදල කපා ගැනීමට හැකිවන පරිදි හිඟ මුදල් ප්‍රමාණය නිලධාරියාගේ විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික මුදල් හෝ පිළිබඳ වූ ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කළ යුතුය.

III. එසේම අරමුදලට ණය වී සිටින නිලධාරියකු ඉල්ලා අස්වන විට හෝ තනතුර අතහැර යන විට හෝ සේවයෙන් පහ කරනු ලබන විට හෝ අන් අයුරකින් රජයේ සේවයෙන් ඉවත්වන විට, ඒ බව අදාල අනෙකුත් සියලුම විස්තර සහිතව අරමුදලේ පරිපාලක තැනට වහාම වාර්තා කළ යුතුය.

03. ආපසු අය කර ගැනීම.

I. යම්කිසි නිලධාරියෙකුට විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක්, අර්ථසාධක අරමුදලින් ගෙවිය යුතුමුදලක්, නොගෙවූ වැටුපක් යනාදිය ගෙවීමට පෙරද යම්කිසි නිලධාරියෙකුට ලැබිය යුතු ඇප මුදලක් හෝ වෙනත් මුදලක් ඔහුට ගෙවන ලෙස නියම කිරීමට පෙරද එමනිලධාරියාගෙන් ලෝහෝර් ආර්යා අරමුදලට අයවිය යුතු සියලුම හිඟ මුදල් සම්පූර්ණ වශයෙන් අය කර ගනු ලබන බවට,

සහතික කරන නිලධාරීන් වගබලා ගත යුතුය. සහතික කරන නිලධාරීන් එසේ වගබලා ගැනීමට අපොහොසත් වුවහොත් එකී ණය ලබාගත් අයගෙන් අයවිය යුතුව තිබී අයකර ගත නොහැකි වූ කවර මුදලක් වුවද සහතික කරන නිලධාරීන්ගෙන් අය කර ගැනීමට සිදුවනු ඇත.

II. යම්කිසි නිලධාරියකුට මේ උපදෙස් පිළිපැදීමට නොහැකිවීම නිසා අරමුදලට යම්කිසි මුදලක් පාඩු වුවහොත් හෝ යම්කිසි ණයක් නොලැබී ගියොත්, ඒ මුදල එකී නිලධාරියාගෙන් අයකර ගැනීමට හැකිවන අතර, මේ උපදෙස් නොපිළිපැදීමේ පදනම මත ඔහුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට සිදුවනු ඇත.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය.